**සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රාග්ධන ප්‍රදාන මඟින් මිලදී ගනු ලබන වත්කම් ගිණුම්ගත කිරීමේ හා එම වත්කම් ක්‍රමක්ෂය කිරීමට ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන එකී ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරිමට කටයුතු කරනු ලබන බව. | ප්‍රාග්ධන ප්‍රදාන මඟින් මිලදී ගනු ලබන වත්කම් ගිණුම්ගත කිරීමේ හා ක්‍රමක්ෂය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව 2014 වර්ෂයට අදාලව රේඛිය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂයන් ලෙස රු.4,412,405 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද අමාත්‍යාංශයේ තොරතුරු වලට අනුව එවැනි ශේෂයක් පදනමට ගෙවීමට නොමැති බව නිරීක්ෂණය විය. තවද වර්ෂ ගණනාවක සිට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ගෙවිය යුතු ලෙස රු.625,490 ක් ඉදිරියට ගෙනවිත් තිබුණද පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව අනුරූපී ලැබිය යුතු ශේෂයක් එම මූල්‍ය ප්‍රකාශනවල දක්වා | 2019 වසරේ සිට කළමණාකරණ මණ්ඩලය මඟින් නිශ්චිත තීන්දුවක් ගන්නා බව. | අදාල ආයතනවලින් තහවුරු ලබාගෙන එම ශේෂ නිරවුල් කිරීමට හෝ ලියාහැරීමට කටයුතු කළ යුතුය. |

නොතිබුණි.එසේ වුවත් මෙම වෙනස්කම් පිලිබඳ සොයා බලා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ගෙවිය යුතු ගිණුම් | 10,763,206 | ශේෂ සනාථ කිරීම් | ශේෂ සනාථ කිරීම් ලබා ගැනීමට ලිපි යවා ඇති බව. | සනාථ කිරීම් කඩිනමින් ලබා ගෙන ණය ශේෂ නිරවුල් කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට පදනමෙහි නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු. 3,073,056 ක් වූ උත්සව අත්තිකාරම් සහ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | 2012 නොවැම්බර් 07 දින පවත්වන ලද පොදු ව්‍යාපාර සඳහා වූ කාරක සභාවේදී වසර පහක් තුළ ලංකා කම්කරු කොංග්‍රසයෙන් ආපසු අයකර ගැනීමට අවධාරණය කරන ලද රු. 2,457,239 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. | ඉල්ලීම් කලද කම්කරු කොංග්‍රසය ගෙවීමට කටයුතු කර නොමැති බව. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිරදේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට පරිගණක දත්ත පද්ධතියක් ඇති කිරීමට 2014 වර්ෂයේ ලබාදුන් රු. 541,840ක අත්තිකාරම් මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව හැකි ඉක්මනින් කටයුතු සිදු කරනු ලබන බව. | අයකර ගැනීමට අවශ්‍ය විධි විධාන යෙදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වර්ෂ 5 කට වැඩි කාලයක සිට ජංගම වත්කම් යටතේ පැවති එකතුව රු. 13,677,199 ක් වූ අත්තිකාරම් ශේෂ නිරවුල් කර ගැනීමට හෝ අදාල කාර්යය ඉටුකර ගැනීමට පදනම විසින් ක්‍රියාකර නොතිබුණි. | මෙම අත්තිකාරම් මුදල් ශේෂ වලට අදාල කාර්යයන් නිම කිරීමට පෙර විවිධ හේතූන් මත අයකර ගැනීමට අපොහොසත් වී ඇති බව. | නොපියවූ අත්තිකාරම් නිරවුල් කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ සිට ගෙවිය යුතු එකතුව රු. 605,312 ක් වූ විදුලි බිල් , දුරකථන බිල් සහ ජල බිල් සමාලෝචිත වර්ෂයේදීද ගෙවීමට පදනම කටයුතු කර නොතිබුණි. | විදුලි සහ ජල බිල්පත් රේඛීය අමාත්‍යාංශය මඟින් සෘජුවම ගෙවා ඇති බව. | මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු. 91,566,028 ක් වූ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වටිනාකමින් රු. 385,867 ක වැටුප් සෘජුවම අමාත්‍යාංශය මඟින් පියවා ඇති බව. | නිරවුල් කරන ලද ශේෂ ගිණුම්වලින් ඉවත් කිරීමටත් ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2013 පෙබරවාරි සිට 2013 ජූලි දක්වා කාලපරිච්ඡේදයට අදාල අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතුව තිබූ රු.4,205,283 ක් ගෙවීම් කර නොතිබුණි. | මෙම ණය ශේෂය නිරවුල් කිරීමට අදාල ප්‍රතිපාදන පදනම සතුව නොමැති බව. | වගකීම් නිරවුල් කිරීම සඳහා ක්‍රමවේදයක් කඩිනමින් සකස් කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(1) | ගිණුම්වලින් ඉදිරියට ගෙන එමින් පවතින රු. 177,688 ක සුළු මුදල් අග්‍රිම ශේෂයක් පැවතුණි. | අත්තිකාරම් ලබා ගත් පුද්ගලයා හට නඩු ගොනුවක් පවතින බැවින් එය ආපසු අය කර ගැනීමට නොහැකිව පවතින බව. | කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය විධි විධාන යෙදිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 371(2) | වර්ෂ කිහිපයක සිට පදනමේ නිලධාරියෙකුට ලබාදී තිබූ රු. 523,000 ක අත්තිකාරම් මුදල පියවා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | නිලධාරියාගේ සේවක අර්ථ සාධක අරමුදල් වලට අදාල ලිපිගොනු තවම ආයතනය සතු වන බැවින් මේ සම්බන්ධව තීරණයක් ගැනීමට හැකි බව. | අයකර ගැනීමට අවශ්‍ය විධි විධාන යෙදිය යුතුය. |
| (ආ) | 2003 ජූලි 02 දිනැති අංක පීඩී/12 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.5.3 ජේදය | 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි. | 2018 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 26,996,086 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 29,644,908 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,648,822 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ස්ථාවර වත්කම් ක්ෂය වියදම අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේ පදනම විසින් රු. 150,000 ක වියදමක් දරා බාහිර උපදේශකවරයෙකු වෙතින් සකස් කරවා ගත් බඳවා ගැනීමේ පටිපාටිය 2022 වර්ෂය වන විටත් අනුමත කරවා ගෙන නොතිබුණි | බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමට පෙර පදනමේ වර්තමාන කාර්යභාරය හා අරමුණුවලට ගැලපෙන අයුරින් කාර්යමණ්ඩලය නැවත සකස් කර පසුව බඳවා ගැනීමේ පරිපාටි සකස් කරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත. | එම දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2005 අංක 19 දරන පදනම පිහිටවූ පනතේ 10(2) වගන්තිය යටතේ පදනමට පවරා දී තිබුණු ඉඩම් හා ගොඩනැගිලි සඳහා ඔප්පු පිළියෙල කර නොතිබීම නිසා පදනමේ සියලු නිශ්චල දේපල අමාත්‍යාංශයට පවරා දීමට නොහැකි වී තිබුණි. | හැටන් හි පිහිටි තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ අදාල ඉඩම් හා ගොඩනැගිලි සඳහා අයිතිය අඹගමුව ප්‍රාදේශිය මහලේකම් කාර්යාලය මඟින් ලබා දී ඇත. නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණයේ ලිපි ගොණු කිසිවක් පදනම වෙත ලබා නොදීම මත ඒ සඳහා හිමිකම් ඔප්පු සකස් කිරීමට ඉතා අපහසුව පවතී. | හිමිකම් තහවුරු කර ගැනීම සඳහා ලියවිලි සකස් කර ගත යුතුය. |
| (ඇ) | පදනම විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 44 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර පදනම වෙත නීත්‍යානුකූල අයිතිය පවරා නොගත් ඉඩම් වල ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 35 ක් ඉදිකිරීමට 2012 වර්ෂයේදී ඉඩම් මැනුම් කටයුතු සඳහා රු. 2,359,298 ක් වැයකර තිබුණද , එම වියදම නිෂ්කාර්යය වියදමක් වී තිබුණි. | මෙම ඉඩම් මැනීම සිදු කලද, පවරා ගැනීමකින් තොරව එම මධ්‍යස්ථාන වල වැඩ ආරම්භ කොට ඇත. | ආර්ථික වශයෙන් ඵලදායී ලෙස මුදල් වැය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 නොවැම්බර් 26 දින රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා රු. 5,840,000 ක් වටිනා ඩබල් කැබ් රථයක් යුනයිටඩ් මෝටර්ස් ලංකා(පුද්) සමාගමින් කල් බදු පදනමින් මිලදී ගැනීම සඳහා රු. 1,565,504 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණද වාරික නොගෙවීම මත 2015 නොවැම්බර් මාසය වන විට මෙම රථය කල්බදු සමාගම විසින් අත්පත් කරගෙන තිබුණි. | නැවත මේ සම්බන්ධයෙන් කල්බදු සමාගම සමඟ සාකච්ඡා කර අය කර ගැනීමට හැකිද යන්න පිළිබඳව කටයුතු කරන බව. | කල්බදු සමාගම සමඟ සාකච්ඡා කර එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය යටතේ (Self- Employment Loan Project) ප්‍රජාශක්ති මධ්‍යස්ථානවලට ලබාදීම සඳහා 2014 දෙසැම්බර් 01 දින මිලදී ගෙන තිබුණු රු. 736,000 ක් වටිනා සිමෙන්ති බ්ලොක් ගල් මැෂින් 8 ක් ස්වයං රැකියාලාභීන් වෙත බෙදා දීමකින් තොරව 2022 මාර්තු වන විටත් නිෂ්ක්‍රියව පැවතුණි. | මෙම මැෂින් 08 ප්‍රජාශක්ති මධ්‍යස්ථානවල ස්වයං රැකියා වැඩ සටහනක් යටතේ පවත්වාගෙන යාමට යෝජනා කර ඇති අතර එම ව්‍යාපෘතිය මෙම වසරේදී ක්‍රියාවට නැංවීමට කටයුතු කරන බව. | ඵලදායී කාර්යකට යෙදවීමට අවශ්‍ය කටයුතු යෙදිය යුතුය. |